# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

| 33 | S | I,II |
|---|---|---|

**ඉතිහාසය I, II**
**History I, II**

**කාලය පැය තුනයි.**

**නම / අංකය : ........................................................................**

**10 ශ්‍රේණිය**

## I කොටස

- ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.

1. මහා වංශයේ මුල් කොටස රචනා කළ මහානාම හිමි වැඩ වාසය කරන ලද්දේ,
   i. දික්සඳ සෙනෙවියා පිරිවෙන
   ii. මරුගන පිරිවෙන
   iii. සුන්හාත පිරිවෙන
   iv. සුනේත්‍රා දේවි පිරිවෙන

2. පහත සඳහන් කරුණු අතරින් ප්‍රථම ඓතිහාසික යුගයේ ශ්‍රී ලංකාවේ මානව කටයුතුවල ප්‍රධාන වෙනස්කම් ඇතිවීමට හේතු වූ සාධකය වන්නේ,
   i. ආහාර පුලුස්සා කෑමට ගැනීම
   ii. සතුන් දඩයම් කර ආහාරයට ගැනීම
   iii. ගල් ගුහාවල ජීවත්වීම
   iv. යකඩ භාවිතය ආරම්භ වීම

3. ''එදා හෙළ දිව'' කෘතිය රචනාකල ඉංග්‍රීසි ජාතික ලේඛකයා වූයේ,
   i. විලියම් ග්‍රෙගරිය
   ii. රොබට් නොක්සස්ය
   iii. එච්.පී.බෙල්ය.
   iv. ලෙනාඩ් වුල්ෆ්ය.

4. සාහිත්‍ය මූලාශ්‍ර මගින් විස්තර කරන කාලයට පෙර තිබූ යුගය හැඳින්වෙන්නේ,
   i. පූර්ව ඓතිහාසික යුගය
   ii. ප්‍රාග් ඓතිහාසික යුගය
   iii. ඓතිහාසික යුගය
   iv. මුල් ඓතිහාසික යුගය

5. ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ඉරණමඩු සැකැස්මට අයත් ප්‍රදේශය වන්නේ,
   i. පහතරට වියළි කලාපයයි.
   ii. කඳුකර උස්බිම් සහිත ප්‍රදේශයයි.
   iii. තෙත් කලාපයේ මැටි සහිත ප්‍රදේශයයි.
   iv. අර්ධ ශුෂ්ක කලාපයේ මැටි හා බොරළු තට්ටුවයි

6. පහත සඳහන් විදේශීය ජාතිකයින් අතුරෙන් ශ්‍රී ලංකාවෙට පැමිණ ඇති තතු දැකබලා වාර්තා සැකසුමක් දැක්වෙන පිළිතුර වන්නේ,

A. - පාහියන් හිමි
B. - ප්ලිනි
C. - ඇරිස්ටෝටල්
D. - රිබෙයිරෝ
E. - ඉබන්බතූතා
F. - ටොලමි

i. A,B,C
ii. A,D,E
iii. A,E,F
iv. A,C,E

7. මෙරටින් හමු වී ඇති පැරණිතම කාසි හඳුන්වා ඇත්තේ,
i. තහාපණ
ii. රන්කාසි
iii. රන් කහවණුව
iv. මස්ස

8. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පහතරට තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ,
i. පතිරාජවෙල
ii. හෝර්ටන්තැන්න
iii. බෙල්ලන්පැදිපැලැස්ස
iv. බටදොඹලෙන

9. මෙරට ශාසන ඉතිහාසයට මුල් තැනක් දෙමින් රචිත ග්‍රන්ථයක් වන්නේ,
i. පූජාවලිය
ii. සද්ධර්මාලංකාරය
iii. නිකාය සංග්‍රහය
iv. රාජාවලිය

10. ගල්වල කොටා ඇති ඉර, හඳ වටාපොත, හක්ගෙඩිය, වැනි පැරණි සලකුණුවලින් පෙන්වා ඇත්තේ,
i. නීති වර්ගයන්ය.
ii. ප්‍රාදේශීය මායිම්ය.
iii. ප්‍රදානයන් පිළිබඳවය.
iv. පුරා විද්‍යාත්මක ස්ථානයන්ය.

11. පෙර රජ දවස පරිපාලන සැකැස්මට අයත් වූ නිලධාරීන්
i. මහමත, මපුරුමුකා, අටෙක, බඩගරික
ii. මුරුමුකා, මහමත, අමෙත, බඩගරික
iii. මපුරුමුකා, ශෙනපති, මහමත,බඩගරික
iv. මපුරුමුකා, අමෙත, ශෙනපති, බඩගරික

12. වංසකතාවල හා සෙල්ලිපිවල පට්ටනගාම යනුවෙන් හඳුන්වා ඇත්තේ,
i. වාපිගම්ය
ii. වෙළඳගම්ය
iii. වරාය ආශ්‍රිත ගම්ය
iv. ජනයා අතහැර දැමූ ගම්ය.

13. මීට අවුරුදු 38000කට බහත කාලයකදී ප්‍රාග් ඓතිහාසික මානවයාගේ වාසස්ථානයක්ව පැවති කලුතර දිස්ත්‍රික්කයට අයත් ගල්ලෙන වන්නේ,
i. බටදොඹලෙන
ii. පාහින්ගල් ලෙන
iii. අලිගලලෙන
iv. කිතුල්ගල බෙලිලෙන

14. කුඩා වැව් පද්ධති භාරව කටයුතු කරන ලද්දේ,
    - i. දසගම් ඇත්තන්
    - ii. ගමික
    - iii. ගෘහපති
    - iv. පරුමක

15. සුමනගේ පවුලට අයත් ලෝහ වැඩ රැකියාව ලෙස කල ගෘහපතියෙකු භික්ෂූන් වහන්සේලාට ගල් ගුහාවක් පූජා කළ බව සඳහන් සෙල්ලිපිය වන්නේ,
    - i. පෙරියපුලියන්කුලම
    - ii. කලුදිය පොකුණ
    - iii. සිතුල්පව්ව
    - iv. කොත්ගල්කන්ද

16. තිස්සමහාරාම වැව, ඉදිකරවීමත් කිරිඳි ඔය හරස් කර අමුණක් බැන්දවීමත් සිදු කළ රජතුමා වූයේ,
    - i. මහසෙන් රජු
    - ii. වසභ රජු
    - iii. ධාතුසේන රජු
    - iv. ඉලනාග රජු

17. අරාබි ජාතිකයින් ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිතා කළ නාමය වන්නේ,
    - i. රතුකැට දිවයින
    - ii. තැප්‍රොබාන
    - iii. සෙයිලාන්
    - iv. සිලෝන්

18. ප්‍රාදේශීය පාලකයෙකු හැඳින්වීමට ''පොචනි'' රජ යනුවෙන් සඳහන් ව තිබූ සෙල්ලපිය පිහිටි ප්‍රදේශය වූයේ,
    - i. කොක් ඇබේ
    - ii. ඇඹුල් අඹේ
    - iii. වේවැල්කැටිය
    - iv. සිතුල්පව්ව

19. සිතුල්පව්ව,කොරවක්ගල සෙල්ලපියට අනුව භික්ෂූන් වහන්සේලාට ගල්ලෙනක් පිරිසිදු කර පූජා කළ ගම් නායකයෙකු නොවන්නේ,
    - i. ගමික සුමන
    - ii. ගමික සුනිල
    - iii. ගමික නිදන
    - iv. ගමික සිව

20. ගම් ප්‍රධානීන් පිළිබඳ ව දසගම් ඇත්තන් ලෙස හැඳින්වූ සෙල්ලිපිය වන්නේ?
    - i. තිරියාය
    - ii. කලුදිය පොකුණ
    - iii. දුනුමඩලාකන්ද
    - iv. වෙස්සගිරිය

21. තමන්ගේ දසවෙනි රාජ වර්ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම සිදු කළ රජතුමා වූයේ,
    - i. පණ්ඩුකාභය රජු
    - ii. මහසෙන් රජු
    - iii. වසභ රජු
    - iv. දුටුගැමුණු රජු

22. වියළි කලාපයේ ජනතාව වැව් පද්ධතිය හැඳින්වූයේ,
    - i. ඒලලංගාව
    - ii. වාරි පද්ධතිය
    - iii. වැව් ප්‍රපතනය
    - iv. වැව් රැස

23. පැරණි අනුරාධපුර ග්‍රාමය පිහිටුවා තිබුණේ කුමන ගංගාව අසලද ?
    i. කැළණි ගඟ
    ii. මහවැලි ගඟ
    iii. කලා ඔය
    iv. මල්වතු ඔය

24. බටදොඹලෙන, පාහියන්ගල, බෙලිලෙන ආදි ස්ථාන වැදගත් වන්නේ,
    i. පැරණි ජනාවාස ලෙස පැවතීම නිසාය.
    ii. මෑතකදී කැණීම් කල නිසාය.
    iii. ප්‍රාග් ඓතිහාසික මානවයා විසූ ලෙන් වීම නිසාය.
    iv. ආරක්ෂිත ස්ථාන ලෙස පැවතීම නිසාය.

25. පුරාණ කාලයට අයත් සාහිත්‍ය ආගමික, තොරතුරු හා වංශ කතා ලියවී ඇත්තේ,
    i. ගල් පුවරු මතය
    ii. කටාරම්වලය
    iii. රන් හා තඹ පත්වලය
    iv. පුස්කොළ පොත්වලය.

26. ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී අභිලේඛන යන කාණ්ඩයට අයත් වන්නේ,
    i. තඹකාසි, රිදී කාසි, අන් කාසි ආදියේ ඇතුළත් ලේඛන
    ii. මැටි පුවරු , තඹ තහඩු ආදියේ ලියා ඇති ලේඛන
    iii. පුස්කොළ පොත්වල ලියූ ලේඛන
    iv. ගිරි ලිපි, ටැම් ලිපි, ලෙන් ලිපි ආදිය

27. ශ්‍රී ලංකාව ජනාවාස වූයේ,
    i. විජය කුමරු ඇතුලු ආර්ය කණ්ඩායමෙනි.
    ii. ආදි කාලීන හෝමෝ සාපියන් මානවාගෙනි.
    iii. විජායි කුමරිය ඇතුලු කණ්ඩායමෙනි.
    iv. දකුණු ඉන්දියාවෙන් පැමිණි ද්‍රවිඩ ජනයාගෙනි.

28. ලංකාවේ විවිධ ප්‍රදේශවල සිදුකල පුරා විද්‍යාත්මක කැණීම්වලනි කාසි, ආභරණ, මැටි බඳුන් වැනි ද්‍රව්‍ය හමු වී ඇත. මේවා අධ්‍යයනය කිරීමෙන් බැස ගත හැකි නිගමනය වන්නේ,
    i. ලෝහ භාණ්ඩ තැනීමට අවශ්‍ය අමුද්‍රව්‍ය තිබූ බවයි.
    ii. දක්ෂ කැටයම් ශිල්පීන් සිටි බවයි.
    iii. කාන්තාවන් රූ සපුව අලංකාරයට ආභරණ පපැළඳි බවයි.
    iv. තාක්ෂණය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පැතිරී තිබූ බවයි.

(ලකුණු - 28යි)

## II කොටස

- ප්‍රශ්ණ 04 කට පමණක් පිළිතුරු සපයන්න (පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.)

**කාලය පැය 02 යි**

01\. දී ඇති ලංකා සිතියමෙහි පහත දැක්වෙන ස්ථාන ලකුණු කරන්න.

මහවැලි ගඟ, ඉබ්බන්කටුව, මිහිහාගල් කන්ද, කැළණි ගඟ, කලා ඔය, දඹකොළ පටුන, මහනුවර, මන්නාරම් දූපත, ත්‍රිකුණාමලය, මැණික් ගඟ

(ලකුණු -10 යි)

(ආ) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් පිළිතුරු පත්‍රයේ ලියන්න.



A

1.මෙම පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

2.ඔහු ජීවත් වූ රට කුමක්ද?

3.මොහු කිනම් ජාතිකයෙක්ද?

4.ඔහු සම්බන්ධ වන විෂය ක්ෂේත්‍රය කුමක්ද?

(ලකුණු - 04යි)



B

1.මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද?

2.මෙම මූර්තිය පිහිටා ඇත්තේ කොහිද?

3.මෙම කැටයමින් නිරූණය වන්නේ කුමක්ද?

4.මෙමගින් හෙළිවන කලා සම්ප්‍රධාය කුමක්ද?

(ලකුණු - 04යි)

02\. (1) තමන් විසින් නොදුටු එහෙත් වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තබා ඇති පහත සඳහන් කතුවරුන් නියෝජනය කල රට පිළිවෙළින් නම් කරන්න.

A - හියුං සැයෑං
B - මෙගස්තිනිස්
C - ප්ලිනී

(ලකුණු - 03යි)

(2) ඓතිහාසික වැදගත්කමකින් යුත් සීගිරි චිත්‍ර මගින් අභීත කාන්තාවන්ගේ තොරතුරු ලබාගත හැකි අංශ 02 ක් සඳහන් කරන්න.

(ලකුණු -04 යි)

(3) (a) මුල් ඓතිහාසික යුගය ලෙස සැලකෙනුයේ කවර කාලවකවානුවක්ද?

(b) සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන්ව තිබූ වාපිගාම 03ක් නම් කරන්න.

(ලකුණු - 05 යි)

(4) පූර්ව ඓතිහාසික යුගයේ පරිවර්තනීය ලක්ෂණ 03 ක් සඳහන් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු - 06 යි)

03. (1) දකුණු පළාතට අයත් අර්ධ ශුෂ්ක කලාපයේ කැණීම් කරන ලද ස්ථාන තුනක් නම් කරන්න.

(ලකුණු - 03 යි)

(2) ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත්ව සිටි ප්‍රධාන රිසර කලාප හතරක් නම් කරන්න.

(ලකුණු - 04 යි)

(3) ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසුන්ගේ ජීවන රටාවේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණා තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.

(ලකුණු - 05 යි)

(4) මෙරට ගල් යුගයේ ආහාර රටාව සකස් වී තිබූ ආකාරය කරුණු 02 කින් විස්තර කරන්න.

(ලකුණු - 06 යි)

04. (1) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් මහාශිලා සුසාන හමු වී ඇති ස්ථාන 03 ක් නම් කරන්න. (ලකුණු - 03 යි)

(2) පහතින් සඳහන් කර ඇති විසූ ගම්, වරහන් තුලින් තෝරා නම් කරන්න.

A - වඩුවන් විසූගම්
B - ධීවරයින් විසූගම්
C - ගොපල්ලන් විසූගම්
D - ගොවියන් විසූ ගම්

(කේවට්ටගාම, කසීකාරගාම,පට්ටනගාම, කුම්භකාරගම, ගෝපාලගාම, මතාරගාම, වඩ්ඪකීගාම)

(ලකුණු - 04 යි)

(3) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාරය උදාහරණ සහිතව කරුණු 02 කින් පැහැදිලි කරන්න.

(ලකුණු - 05 යි)

(4) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් උඩරංචාමඩමේ නේවාසික ස්ථානයේ සිදුකල කැණීම්වලින් හෙළිකරගත් තොරතුරු කරුණු 03 ක් මගින් විස්තර කරන්න.

(ලකුණු - 06 යි)

05. (1) පහත සඳහන් විශේෂ නාමයන් භාවිතා කළ රජවරුන් පිළිවෙලින් නම් කරන්න.

A - මින්නේරි දෙවියන්

B - නරේශ්වර

C - කාලිංග චක්‍රාවර්ති ස්වාමීන් වහන්සේ

(ලකුණු - 03 යි)

(2) ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු බිහිවූ රාජ්‍ය පරිපාලනයට සම්බන්ධ පහත දැක්වෙන තනතුරු අතීතයේ හැඳින් වූ ආකාරය වරහන් තුලින් තෝරා ලියන්න.

(ශෙනපති, මහමත,කනඩේික, බඩගරක, බතගු,හති අදෙන, නතර ගුහිත, පන අදෙන)

A - නගර පරිපාලක

B - රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී

C - සේනාපති

D - භෝජනාගාර අධිපති

(ලකුණු - 04 යි)

(3) ගමක ප්‍රධානියා වූ ගමිකගේ කාර්යයන් 03 ක් නම් කර ඉන් එකක් විස්තර කරන්න.
(ලකුණු - 05 යි)

(4) වසභ රජතුමාගෙන් සිදු වූ ආගමික හා ආර්ථික සේවාවන් විස්තර කරන්න.
(ලකුණු - 06 යි)

(01) (අ) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම

